## නිවේදන ඉගෙන ගනිමු.

**නිවේදනයක් යනු,**

කිසියම් සිද්ධියක්, තොරතුරක්, දැනුවත් කිරීමක්, අනතුරු ඇඟවීමක් පිළිබඳව දැනුම් දීමකි.

නිවේදනයක කොටස් කිහිපයක් ඇත.

- කවුරුන් විසින්ද?
- කාහටද?
- කුමක් සඳහාද?
- කවදාද? (දිනය)
- කීයටද? (වෙලාව)
- කොහේද? (ස්ථානය)

**කරුණාවෙන් සවන් දෙන්න.**

මේ ඔබ අමතන්නේ විදුහලේ මාධ්‍ය අංශයයි,

මේ නිවේදනය විදුහලේ සියලුම ශිෂ්‍ය නායක නායිකාවන්ටයි. අප විදුහලේ වාර්ෂිකව පවත්වනු ලබන ගුරු උපහාර උළෙල මෙවරත් ඔක්තෝබර් මස 6වන දින පැවැත්වේ. ඒ පිළබඳ සාකච්ඡාවක් හෙට පස්වරු 2.00ට ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට නියමිතය. මේ සඳහා සහභාගී වන ලෙස සියලුම ශිෂ්‍ය නායක නායිකාවන්ට දැනුම් දෙමි.

ස්තුතියි!

1. පහත සඳහන් නිවේදනයේ නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

කරුණාවෙන් 1) .........................

මේ නිවේදනය සියලුම 2) ............................ ටයි.

වාර්ෂිකව පවත්වනු ලබන 3) ................................................ මෙවරද නොවැම්බර් මස 4) ................... පෙ.ව. 5) ..................... ට 6) ................................ දී පැවැත්වීමට නියමිතය. මේ සඳහා සෑම සිසුවෙකුම තම ගෙවත්තේ වගා කර ඇති 7) ..................... , 8) ..................... රැගෙන පෙ.ව. 7.30 වන විට පාසලට පැමිණිය යුතුය. පොළ සකස් කිරීමට හා 9) ....................... මිලදී ගැනීමට පාසලට පැමිණෙන ලෙස ඔබේ 10) ............................ දැනුවත් කරන්න.

ස්තූතියි!

(භාණ්ඩ / 9.00 / සවන්දෙන්න / එළවළු / පාසල් පොළ / ශිෂ්‍ය ශිෂ්‍යාවන් / 28වන සිකුරාදා / දෙමාපියන් / පලතුරු / පාසල් ක්‍රීඩා පිටියේ )

2. පාසල් සංවර්ධන සමිතිය ජූලි 08වනදා ප.ව. 2.00ට බව පාසලේ සියලුම සිසුන්ට දැනුම් දෙන නිවේදනයක් සකස් කරන්න.